M 439

# ළමා අයිතිවාසිකම් හා දඬුවම් විධිවිධාන යටතේ පාසල් විනය පවත්වා ගැනීම පිළිබඳ අධ්‍යයනයක්.

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය

University of Colombo Library Sri Lanka

උදයරුවන් මල්ලිකාරච්චි,
2008/MPhil/07
ගෞරව උපාධි,(සමාජ විද්‍යාව)
අධ්‍යාපන ඩිප්ලෝමා,(Dip.Ed)
අධ්‍යාපනපති.(M.Ed)

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
2013 ඔක්තෝම්බර්.

UCLIB
567834

567834

## Abbreviation

Child rights and discipline in school are issues that are widely discussed in society. Disciplining children as well as imparting forma education is an inescapable responsibility of the school. Using punishment as a traditional way of disciplining children is an offence according to child rights and the law of education. but school anti-disciplinary activities have gone up. There is no definite idea as to how discipline should be maintained among the participants of Education. In this situation, a study has been initiated on *"conducting discipline at school according to the child rights and punishment regulations"*. This research is conducted under five objectives. They are as follows. Consideration of anti disciplinary activities at school and the factors which are connected to it, review of the attitudes of the principals, teachers, students and resource persons regarding management of school discipline, reviewing of the methods adopted by the principals and teachers at present, against indiciplinary actions, to find out the difficulties faced by the principals, teachers regarding management of discipline, finding out whether it is possible to maintain fair discipline in accordance with the legal framework. This survey is carried out by considering 25 schools in the Colombo district, using the descriptive research methodology. Data collected through questionnaires, interviews, aptitude scales, direct

indirect observations. Qualitative and quantitative methods have been used in analyzing and interpretation. Some of the indiciplinary activities in classroom and learning are unethical acts, unsuitable uniform, harassing students by students themselves and love affairs. The reasons of the are mismanagement of time, factors related to attendance, being unable to identify the students, incompetence of the principals, low performance and hereditary factors related to social and physical environment by and large to indiciplinary activities in school. The participants of the survey have expressed their agreement towards punishment. It has been revealed that largely, simple punishments both physical and mental as well as rigorous punishment very rarely have been used while alternative methods have been used considerably to a certain extent at schools. It is also reveled; teachers and principals face various problems officially and personally because of indiciplinary actions. According to the prevailing social conditions, It is impossible to maintain discipline according to child rights and punishment regulations at school level. In conclusion, we can arrive at the idea of the difficulty in preparing an active model for school discipline, by going into the extremes of disciplinary and non disciplinary actions. In deciding which method should be implemented in relation to managing discipline in school without considering the views of one social group. It is beneficial if an active discussion is initiated by making use of social and cultural values.

## සාරාංශය

ළමා අයිතිවාසිකම් මෙන් ම පාසල් විනය ද මෑතකාලීන ව සැලකිය යුතු මට්ටමින් සංවාදයට ලක් වී ඇති ප්‍රස්තුත දෙකකි. අධ්‍යාපනය ලබා දීම හා සිසුන් මනා විනයගරුක පිරිසක් බවට පත් කිරීම පාසලට පැවරී ඇති අනිවාර්ය වගකීමකි. විනය උදෙසා පාසල බහුල වශයෙන් භාවිත කළ සාම්ප්‍රදායික උපායමාර්ගය වන දඬුවම, තව දුරටත් නඩත්තු කිරීම ළමා අයිතිවාසිකම් හා අධ්‍යාපන නීතිය අනුව වරදකි. එහෙත් පාසල් විනය විරෝධී ක්‍රියා සංඛ්‍යාත්මක ව ඉහළ ගොස් ඇති පසුබිමක විනය පවත්වා ගැනීම සඳහා අනුගමනය කළ යුත්තේ කවර ක්‍රියාමාර්ග ද යන්න පිළිබඳ පාර්ශ්වකරුවන් අතර නිශ්චිත අදහසක් නොමැත. මෙම පසුබිම තුළ **"ළමා අයිතිවාසිකම් හා දඬුවම් විධිවිධාන යටතේ පාසල් විනය පවත්වා ගැනීම"** මැයෙන් අධ්‍යයනය අරමුණු පහක් ඔස්සේ දියත් කෙරුණි. පාසල් විනය විරෝධී ක්‍රියා සහ ඊට බලපාන පාසල හා බැඳුණු සාධක විමසා බැලීම, පාසල් විනය කළමනාකරණය පිළිබඳ ගුරු, විදුහල්පති, සිසු ආකල්ප විමසා බැලීම, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් පාසල් විනය විරෝධී කටයුතු සම්බන්ධයෙන් දැනට කටයුතු කරන ආකාරය විමර්ශනය කිරීම, පාසල් විනය කළමනාකරණය සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන් මුහුණ දෙන ගැටලු අනාවරණය කර ගැනීම, දඬුවමට අදාළ නෛතික රාමුව සුරකිමින් මනා පාසල් විනයක් පවත්වා ගත හැකිදැයි සොයා බැලීම එම අරමුණු වේ. කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 25ක් යොදාගෙන විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කොට ඇත. ප්‍රශ්නමාලා, සම්මුඛ සාකච්ඡා, ආකල්ප පරිමාණ, ඍජු හා වක්‍ර නිරීක්ෂණ ඇසුරින් රැස් කළ දත්ත, විශ්ලේෂණයේ දී හා අර්ථකථනයේ දී ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමශිල්ප භාවිත කෙරුණි.

ඉගෙනුම හා පංති කාමරය බැඳුණු විනය විරෝධී ක්‍රියා, අසභ්‍ය කටයුතු, නුසුදුසු නිල ඇඳුම, සිසුන් සිසුන්ට සිදු කරන හිරිහැර, ප්‍රේම සබඳතා පැවැත්වීම, පාසල් පරිශ්‍රයේ සැලකිය යුතු මට්ටමකින් සිදු වන විනය විරෝධී ක්‍රියා වන අතර ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කාල කළමනාකරණය, පැමිණීම ආශ්‍රිත සාධක, සිසුන් හඳුනා ගැනීම, සිසුන්ගේ ආරම්ය ස්වභාවයන්, සිසු සාධනය, භෞතික හා සමාජ පරිසරය යන ක්ෂේත්‍රයන්හි පවතින ඌනතා විනය විරෝධී ක්‍රියාවන්ට

බහුල වශයෙන් ඉවහල් වන බවට අනාවරණය වී ඇත. තියැදි පාර්ශ්වකරුවන්ගෙන් වැඩි පිරිසක් පාසල් විනය කළමනාකරණයේ දී දඬුවමට එකඟතාව පළ කොට ඇත. සරල මට්ටමේ කායික හා මානසික දඬුවම් බහුල වශයෙන් ද දැඩිදඬුවම් ලබා දෙන අවස්ථා විරල වශයෙන් ද දඬුවම් නොවන විකල්ප ක්‍රියාමාර්ග සැලකිය යුතු මට්ටමකින් ද පාසල්වල භාවිත කෙරෙන බව අනාවරණය විය. විනය විරෝධී ක්‍රියා නිසා ගුරුවරුන්, විදුහල්පතිවරුන් රාජකාරිමය හා පෞද්ගලික වශයෙන් විවිධ ගැටලුවලට මුහුණ දෙන බව අනාවරණය වී ඇත. මේ අනුව අවසාන වශයෙන් ළමා අයිතිවාසිකම් හා දඬුවම් විධිවිධාන යටතේ, සපුරා දඬුවමින් බැහැර ව පාසල්වල විනය පවත්වා ගැනීම, පවතින සමාජ යථාර්ථය අනුව උගහට කරුණකි. ප්‍රායෝගික වශයෙන් විනය කළමනාකරණයට ඇවසි කාර්යක්ෂම ආකෘතියක් තැනීමේ දී දඬුවම් දීමේ අන්තයට හා දඬුවම් ලබා නොදීමේ අන්තයට අයත් ක්‍රියාමාර්ග එතරම් පලදායී නොවේ. මේ අනුව පාසල් විනය කළමනාකරණය සම්බන්ධයෙන් කවර පිළිවෙතක් අනුගමනය කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී ඒකපාර්ශ්වික ව ක්‍රියා නොකොට මෙරට සමාජ සංස්කෘතික හරයන් ද සැලකිල්ලට ගනිමින් පුළුල් සමාජ කතිකාවතක් ගොඩනැගිය යුතු ව ඇත.